# වැද්දාගල ගම්මානය පිළිබඳ ව මානවවංශ විද්‍යාත්මක අධ්‍යයනය

එස්.ඩබ්ලිව්.ඒ.කේ.දර්ශිත[50]

---

නූතන තරඟකාරී ආර්ථික රටාව තුළ සාම්ප්‍රදායික ගම පිළිබඳ සංකල්පය කෙමෙන් කෙමෙන් මානව මතකයෙන් ගිලිහී යමින් පවතී. මෙකී ධර්මතාවයෙන් මිදී සිටීමේ හැකියාවක් මෙම ගවේශනය සිදු කිරීමට අපේක්ෂා කරන වැද්දාගල ගම්මානයටද නොතිබිණි. මෙම වැද්දාගල ගම්මානයේ ඉතිහාසය ප්‍රාග් ඓතිහාසික යුගය දක්වා දිව යනු ඇත. විජය කුමරුට දාව කුවේණිය විසින් බිහිකළ දරුවන් දෙදෙනා වූ ජීවහත්ත සහ දිසාලා දරු දෙදෙනා කුවේණියගේ අභාවයත් සමඟ එම ප්‍රදේශයෙන් සපරගමුව ප්‍රදේශයට පැමිණ මෙහි ජනාවාස පිහිටවූ බව ජනප්‍රවාදයේ සදහන්ය. වළගම්බා රාජ්‍ය සමයේ මෙන්ම මහනුවර යුගය තුළදී මෙම ප්‍රදේශය ඓතිහාසික වශයෙන් වැදගත් වේ. ශ්‍රී ලංකාවේ මධ්‍යයම කඳුකරයේ සපරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කුකුළු කෝරළයේ උඩගම් පත්තුවේ පිහිටි මෙම වැද්දාගල ගම්මානය බුළුතොට රක්වාන කඳුවල ගිනිකොණ සිට වයඹ දිගට විහිද යන දකුණු කෙළවරෙහි අඩි 3000 කට වඩා උස් වූ ගොන්ගල සූරියකන්ද,බුත්කන්ද හා සිංහරාජ කඳුවැටි වලින් වටවූ ප්‍රපාතාකාර බෑවුමෙහි දොරුවක පිහිටා ඇත.මෙම මානවවංශ අධ්‍යයනය ඔස්සේ වැද්දාගල ගම කේන්ද්‍ර කරගෙන මෙහි ජන සම්භවය සම්බන්ධයෙන් පවතින විවිධ මතවාද පිළිබඳව ද, ඔවුන්ගේ සාම්ප්‍රධායික චාරිත්‍ර වාරිත්‍ර හා ඇදහිලි පිළිබඳව ද,සමාජ ආර්ථික රටාව ද,ජනකවි ජනසාහිත්‍යය හා ගම හා බැදි වාස්තුවිද්‍යාත්මක නිර්මාණ ආදිය පිළිබඳවද ඔවුනොවුනගේ ඥාතීත්ව සබදතාවයන් පිළිබඳව ද මානවවංශවිද්‍යාත්මක අධයනයක් සිදු කිරී මෙහි අභිප්‍රාය වේ.මෙම මානවවංශ විද්‍යාත්මක ගවේශනය සාර්ථක කර ගැනීම සඳහා ගවේශන ක්‍රමවේදය වශයෙන් ක්ෂේත්‍රය ගවේශනයට ප්‍රථමව මෙම වැද්දාගල ගම්මානය පිළිබඳව පුස්තකාල ගවේශනයෙන් ලබාගත්තා වු දත්ත ඔස්සේ අදාල ක්ෂේත්‍රය වෙත ප්‍රවේශ වී ක්ෂේත්‍රය පිළිබඳ ගවේශනය කිරීම හා සම්මුඛ සාකච්ජා ඔස්සේ දත්ත සපයා ගැනීමට සිදු විය.මුලික ගවේශන කටයුතුවලදී මෙම වැද්දාගල ගම්මානය තුළ කිරාවැව, වැද්දා දඩුගැසූ ගල, අවසන් වැද්දා වාසය කලා යැයි සැලකෙන ගල් ගුහාව,වැදි ජනයා ආහාර කල් තබා ගැනීම සදහා භාවිත කරන්නට ඇතැයි සැලකෙන ගල් වලවල් වැනි ඓතිහාසික සාධක මෙන් ම මෙහි ගම්වැසියන්ට ආවේණික වු භාෂාව, විවාහ චාරිත්‍රවාරිත්‍ර අවමංගලය චාරිත්‍ර, පත්තිණි දේව විස්වාසය වැනි විස්වාසයන්, බට හෝ ඉළුක් සෙවිලි කළ සාම්ප්‍රධායික වාස්තුවිද්‍යාත්මක නිවාස ආකෘති ආදිය පිළිබඳව ද හඳුනාගැනීමට හැකි වූ අතර තවදුරටත් ඒ පිළිබඳ පුළුල්  ව අධ්‍යයනය කිරීම සිදුකරන ලදී.

ප්‍රමුඛ පදඃ සාම්ප්‍රධායික ගම,වැද්දාගල,චාරිත්‍ර වාරිත්‍ර

[50] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය,ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය,kasundarshitha1@gmail.com.